මාධ්‍ය නිවේදන අංක 01

## මැතිවරණ කොමිෂන් සභාව

**2022.01.10 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

- 2021 වර්ෂයේ දී දේශපාලන පක්ෂ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර අතරින්

  1. තමිල් මක්කල් කූට්ටනි
  2. නව ලංකා නිදහස් පක්ෂය
  3. දමිළ ප්‍රගතිශීලී සන්ධානය

  යන දේශපාලන පක්ෂ මැතිවරණ කොමිෂන් සභාව පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් ලියාපදිංචි කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි දේශපාලන පක්ෂ නාම ලේඛනය රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම.

- 2022 වර්ෂය සඳහා දේශපාලන පක්ෂ ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර කැඳවීම.

- නොකඩවා සභාවාර තුනක් හෝ අඛණ්ඩව දින 90ක් සභා රැස්වීම් සඳහා නොපැමිණීම මත සභික ධුරය අහිමි වූ පළාත් පාලන ආයතනවල යම් සභිකයකු නැවත එම සභා කාලය තුළ සභික ධුරයක් සඳහා පත් කිරීමට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත අනුව කළ නොහැකි බවට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 ජනවාරි මස 10